කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

## ව්‍යාපෘති අංකය : P166865

## ණය අංකය : IDA - 66190-LK

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ලෝක බැංකුව) වෙත ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ (IWWRMP) පිරිවැය අරභයා ණය මුදලක් සඳහා අයදුම්කර ඇති අතර, එම ණය මුදලේ ලැබීම්වලින් කොටසක් පහත උපලේඛනයේ සඳහන් කොන්ත්‍රාත්තු යටතේ ගෙවීම් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2. IWWRMP ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙනුවෙන් වගුව 01 හි සඳහන් පරිදි පහත සඳහන් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

**වගුව 01**

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ විස්තරය | පළපුරුද්ද/ CIDA ලියාපදිංචිය | ලංසු ඇපකරය හා වලංගු කාලය | ආපසු ගෙවනු නොලබන ලංසු ලිපිලේඛන ගාස්තුව (රු.) | ඉදිකිරීම් කර්මාන්තයේ වාර්ෂික ධාරිතාවයේ සාමාන්‍යය හා ද්‍රවශීල වත්කම් හා/ හෝ ණය පහසුකම්වල අවමය (රු.) |
|---|---|---|---|---|---|---|
| 01 | LK-MOMDE -163059 -CW-RFB | කරියලඉනගපාඩුවත් වැව පුනරුත්ථාපනය (කොන්ත්‍රාත් කාලය දින : 365) | ශ්‍රේණිය – C3 හෝ ඉහළ විශේෂතාවය : වාරිමාර්ග හා ජලාපවහන ඇළ මාර්ග | ලංසු සුරක්ෂණය වටිනාකම : රු. 710,000.00 වලංගු කාලය 2025.10.13 දක්වා | 56,000.00 | මිලියන 670.00 සහ මිලියන 112.00 |

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ලංසු ලිපිලේඛනයේ සඳහන් අවශ්‍යතා සපුරා තිබිය යුතුය. තවද ලංසුකරු සතුව වගුවේ සඳහන් පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ශ්‍රේණිය සඳහා වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

4. ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලීම සඳහා **https://www.iwwrmp.lk/ web/procurement/section/ procurement - notices** යන වෙබ් අඩවියේ පළ කර ඇත.

5. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති විශේෂඥ (ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත්), IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 වෙතින් ලබාගත හැකි අතර, කලින් දැනුම්දීම මගින් **2025-03-17** වෙනි දින සිට **2025-04-17** වෙනි දින දක්වා රාජකාරී දිනවලදී **පෙ.ව .9.00 හා ප.ව. 3.00** අතර, ඉහත සඳහන් ලිපිනයේදී ලංසු ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය. (දුරකථන අංකය: 0112691163)

6. අපේක්ෂිත ලංසුකරුවන්, ඉහත සඳහන් ලංසු ලිපිලේඛන කට්ටලයක් සඳහා ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තුව (මුදල සඳහා වගුව – 01 බලන්න) මුදලින් ගෙවීමෙන් අනතුරුව කලින් දැනුම් දීමෙන් අනතුරුව (දුරකථන අංකය : 011–2691163) **2025-03-17** වෙනි දින සිට **2025-04-12** වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි **09.30 පැය හා 15.00 පැය** අතර, ව්‍යාපෘති අධ්‍යක්ෂ, IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 වෙත සමාගම් / ආයතන ලිපි ශීර්ෂයේ ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හෝ ලංකා බැංකුවේ හයිඩ්පාක් ශාඛාවේ ඒකාබද්ධ ජලාධාර හා ජලසම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය නමින් පවත්වාගෙන යනු ලබන අංක **7042633** දරන ගිණුමට එකී ලිපිලේඛන ගාස්තුව බැර කර ලබාගත් බැංකු ලදුපතේ ස්කෑන් කරන ලද පිටපතක් ලංසු ලිපි ලේඛන ඉල්ලා ලිඛිත ඉල්ලීම් ලිපියක් සමග **iwwrmp@sltnet.lk** විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් ලංසු ලිපිලේඛන ලබාගත හැකිය.

7. පූර්ව ලංසු රැස්වීමක් හා වැඩ බිම් සංචාරයක් පහත වගුව 2 හි සඳහන් පරිදි පවත්වනු ලැබේ. අදාළ නිලධාරීගේ සහාය ඇතිව වැඩ බිම පරීක්ෂා කර බලන මෙන් ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

**වගුව 02**

| අංකය | කොන්ත්‍රාත් අංකය | වැඩ බිම් පරීක්ෂාව | පූර්ව ලංසු රැස්වීම | ලංසු අවසන් කිරීමේ සහ විවෘත කිරීමේ දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1 | LK-MOMDE -163059-CW-RFB | **දිනය :** 2025.03.25<br>**වේලාව :** පෙ.ව. 10.00<br>**ස්ථානය :** ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය, කිලිනොච්චි බටහිර කොට්ඨාසය, විල්සන් පාර, කිලිනොච්චි | **දිනය :** 2025.03.27<br>**වේලාව :** ප.ව. 2.00<br>සම්මන්ත්‍රණ කාමරය, IWWRMP 2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල. අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07. | **දිනය :** 2025.04.21<br>**වේලාව :** ප.ව. 2.00 |

8. ලංසු ලිපි ලේඛනයේ සියලුම පිටු ලංසුකරු විසින් අත්සන් කර ඔහුගේ මුද්‍රාව තබා තිබිය යුතුය.

9. සම්පූර්ණ කරන ලද ලංසු, පිටපත් දෙකකින් යුතුව, බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්තුවේ නම හා අංකය පැහැදිලිව සඳහන් කර වගුව 02 හි සඳහන් පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂ IWWRM ව්‍යාපෘතිය, 2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල, අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07 වෙත ලියාපදිංචි තැපැල් මගින්, අතින් ගෙනැවිත් භාරදීමෙන් හෝ සීඝ්‍රදූත සේවාව මගින් යොමු කළ යුතුය. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණ සිටීමට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ දෙදෙනෙකුට (2) නොවැඩි බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය,**
**2 වන මහල, මහවැලි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල,**
**අංක 96, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.**
**2025.03.12**